# ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර බැංකුව(IBRD) හඳුනා ගැනීම සහ එහි ක්‍රියාකාරීත්වය පිළිබඳ ව කෙරෙන විමර්ශනයක්

පී.පී. පුබුදුනී සරලා ජයකොඩි[13]

## සංක්ෂේපය

එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුබද්ධිත ආයතනයක් වන International Bank for Reconstruction and Development හෙවත් ලෝක බැංකුව යන නාමයෙන් හඳුන්වනු ලබන්නේ, " ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය පිළිබඳ ව ජාත්‍යන්තර බැංකුව යි. " ආර්ථික සංවර්ධනය සඳහා ණය පහසුකම් සැපයීම ලෝක බැංකුවේ ප්‍රධානතම අරමුණ වේ. ආරම්භක අවස්ථාවේ දී, යුරෝපා රටවල මූල්‍ය අර්බුදයට ආධාර කිරීම ලෝක බැංකුවේ මුඛ්‍ය අරමුණ බවට පත් වුවත් අනතුරුව එය තුන්වන ලෝකයේ රටවල් කරා ද, ව්‍යාප්ත විය. ලෝක බැංකුව සතු කාර්යයන් අතර ආර්ථික උපදෙස් ලබා දීම, තාක්ෂණික ආධාර සැපයීම, සංවර්ධනය වන රටවල ආයෝජනය සඳහා අන්‍යයන්ට මඟ පෙන්වීම යනාදී කාර්ය ප්‍රධාන වේ. නමුත් නූතනයේ ගොඩනැඟී ඇති ප්‍රධාන සමාජ කතිකාවතට අනුව, ලෝක බැංකුවේ න්‍යායාත්මක අරමුණු ප්‍රායෝගික තලය තුළ ඒ අයුරින්ම ඉටු නොවීම සම්බන්ධයෙන් ගැටලු පවතී. ඒ අනුව මෙම ලිපිය තුළ ලෝක බැංකුව ස්ථාපිත වූ අයුරු, එහි ව්‍යූහය, අරමුණු සහ කාර්ය, ලෝක බැංකු සාමාජිකත්වය යනාදී ක්ෂේත්‍රයන් හඳුනාගනිමින් ප්‍රායෝගික තලය තුළ ලෝක බැංකුවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ ව අවධානය යොමු කිරීම අරමුණු කොටගෙන ඇත. මෙම අධ්‍යයනය සඳහා ද්විතීයික දත්ත භාවිතා කරන ලද අතර, අධ්‍යයන ක්‍රමවේදය ලෙස විස්තරාත්මක ක්‍රමවේදය හා ඓතිහාසික ක්‍රමවේදය භාවිතා කරන ලදි. ලෝක බැංකුවේ න්‍යායාත්මක අරමුණු ප්‍රායෝගික අරමුණු සමග ගැටීම පාදක කරගත අදාළ ක්ෂේත්‍රයන් පිළිබඳ සාධනීයතා සේම නිශේධනීයතා ද, හඳුනාගත හැකි බව මෙහි අධ්‍යයන නිගමනයයි.

**මුඛ්‍ය පද:** *ලෝක බැංකුව, ආර්ථික සංවර්ධනය, දිළිඳුකම, ප්‍රායෝගික*

## හැඳින්වීම

1945.4.25 වන දින සිට ජූනි 26 වන දින දක්වා කාලය තුළ රටවල් 50 නියෝජිතයන්ගේ සහභාගීත්වයෙන් යුතු ව සැන්ෆ්‍රැන්සිස්කෝ නගරයේ පැවති අන්තර්ජාතික සම්මේලනයේ දී එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය කෙටුම්පත් කරන ලදි. 1945.10.24 වන දින එය බලාත්මක කරන ලදි. මෙම සංවිධානයට අනුබද්ධිත ආයතන රැසක් ඇති අතර ලෝක බැංකුව යනු, එහි ප්‍රධාන අනුබද්ධිත ආයතනයකි. ලෝක බැංකුවට අයත් නියෝජිත ආයතන සංඛ්‍යාව 4කි. එම නියෝජිත ආයතන අතුරින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සුවිශේෂ වේ. ලෝක බැංකුවේ සාමාජිකත්වය ලබා ගැනීමට නම් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සාමාජිකත්වය ලබාගත යුතු ය. ලෝක බැංකුවේ ප්‍රධාන අරමුණු අතර ආර්ථික සංවර්ධනය සහ දිළිඳුකම පිටු දැකීම හඳුනාගත හැකි ය. නමුත් ප්‍රායෝගික තලය තුළ ලෝක බැංකුවේ ක්‍රියාකාරකම් විවේචනය වන අවස්ථා ද, පවතී. ඉන් එක් ප්‍රබල විවේචනයක් වන්නේ, ලෝක බැංකුවේ පෙන්නුම් කරන ඉලක්ක හා සැබෑ ඉලක්ක අතර පවතින ගැටලුවයි. කෙසේ නමුත් මෙම පර්යේෂණ ලිපිය මගින් මෙම සමස්ත ඒකක ආවරණය වන පරිදි ලෝක බැංකුව පිළිබඳ ව සාකච්ඡා කිරීම අපේක්ෂිතය.

---

[13] ශාස්ත්‍රවේදී දේශපාලන විද්‍යා (විශේෂ) ප්‍රථම වසර

## ලෝක බැංකුව

ලෝක බැංකුව (World Bank) යන නාමයෙන් හඳුන්වනු ලබන්නේ "ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර බැංකුවයි" (International Bank for Reconstruction and Development). එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුබද්ධිතව ක්‍රියාත්මක වන මූල්‍ය සැපයීම් කටයුතු, සාමාජික රාජ්‍යයන්හී ආර්ථික සංවර්ධනය සහ දිළිඳුකම පිටුදැකීම වැනි කාරණා පිළිබඳ උපදෙස් ලබා දෙනු වස් ස්ථාපිත ආයතන 5න් එකක් ලෙස ලෝක බැංකුව හඳුන්වා දිය හැකි ය. 1944 ජුලි 01 වැනි දින සිට ජුලි 22 දක්වා කාලසීමාව තුළ පැවති එක්සත් ජාතීන්ගේ මූල්‍ය හා මුදල් සම්මන්ත්‍රණයේ දී, ගනු ලැබූ තීරණයක් ප්‍රකාරව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ස්ථාපිතවීම සිදු විය. ඒ 1946 ජූනි 25 වන දිනය (කටුගම්පළ, 200, 53). ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රථම ණය මුදල ලෙස ඇමරිකානු ඩොලර් දස ලක්ෂ 250ක මුදලක් ප්‍රංශ රජයට පිරිණැමිණි. කෙසේ නමුත් 1945 දෙසැම්බර් 27 වෙනි දින "බ්‍රිටින් වුඩ්ස්" ගිවිසුමට අනුකූලව විධිමත් ලෙස බිහි වූ ලෝක බැංකුව මඟින් තත්කාලීනව යුරෝපයේ උද්ගත වූ මූල්‍ය අර්බුදයට විවිධ පිළියම් ඉදිරිපත් කිරීමද , හඳුනාගත හැකි තත්ත්වයකි.

### ලෝක බැංකුවේ සංවිධාන ව්‍යුහය

ඇමරිකා එක්සත් ජනපදයේ වොෂින්ටන්හී ලෝක බැංකු මූලස්ථානය පිහිටා තිබේ. 1956 සිට 1988 දක්වා කාලය ඇතුළත ලෝක බැංකුවට අනුබද්ධිත නියෝජිත ආයතන 4ක් ස්ථාපිත කෙරිණි (කටුගම්පල, 2007, 54). තාක්ෂණික වශයෙන් ගත් කළ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අනුගත කොටසක් ලෙස ලෝක බැංකුව හඳුනාගත හැකි වුවත්, පාලන ව්‍යුහය අතින් ගත් කළ එහි යම් යම් වෙනස්කම් පවතී. ලෝක බැංකුවේ සාමාජිකත්වය ලබා ගැනීමට නම් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සාමාජිකත්වය ලබාගත යුතු ය. "සාමාජික රටවලින් ලැබෙන දායක මුදලින් බැංකුවේ ප්‍රාග්ධනය ගොඩනැගී ඇති අතර, ඡන්දය හිමි වනුයේ යොදන ලද ප්‍රාග්ධනයට අනුකූලවය. සාමාජිකයෙකුට ඡන්ද 250ක් හිමි අතර ඩොලර් ලක්ෂයක් බැගින් ගෙවීමෙන් ඡන්දයක් බැගින් ලබාගත හැකි ය. (ජයවර්ධන ,2011 , 356). උදාහරණ ලෙස 2006 නොවැම්බර් 1 වැනි දා වන විට එක්සත් ජනපදය සතුව පැවති ඡන්ද ප්‍රමාණය සියයට 16 දශම 4ක් වීම දැක්විය හැකි ය (කටුගම්පළ, 2007, 55). ලෝක බැංකුවේ පාලනය පැවරී ඇත්තේ විධායක මණ්ඩලයේ සභාපතිවරයා වන ලෝක බැංකුවේ සභාපතිවරයාට ය. මහා මණ්ඩලය වසරකට වරක් ද, අධ්‍යක්ෂ මණ්ඩලය මසකට වරක් ද රැස්වේ. සත් දෙනෙකුගෙන් යුතු උපදේශක මඬුල්ලක් ද, වේ. උත්තරීතර මණ්ඩලයක් මගින් පරිපාලන කටයුතු ඉටු කරනු ලැබේ (ජයවර්ධන, 2011, 356 ). ලෝක බැංකුවට අයත් නියෝජිත ආයතන පිළිබඳ විමසීමේ දී, ලෝක බැංකුවට අනුබද්ධිත නියෝජිත ආයතන 4කි. ඒ පිළිබඳ අවධානය යොමු කිරීමේ දී, ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව (IFC) 1956 වසරේ දී ස්ථාපිත කෙරිණි. ස්වෛරී ඇප තබා ගැනීමෙන් තොරව විවිධ ණය මුදල් ලබා දීම මෙමගින් සිදු කෙරේ. (IDA) ජාත්‍යන්තර සංවර්ධන සංගමය ස්ථාපිත කෙරුණේ 1960 වසරේ ය. මෙම ආයතනය මගින් ස්වෛරී ඇප බැඳුම්කරයක් පමණක් තබා ගෙන පොළී රහිත ණය හෝ ප්‍රදාන ලබාදීම සිදු වේ. බහුවිධ ආයෝජන බැඳුම්කර ඒජන්සිය (MIGA) 1988දී ආරම්භ විය. ඇතැම් අවධානම් වෙනුවෙන් රක්ෂණය කිරීම මෙමගින් සිදු කරන අතර විශේෂයෙන් පෞද්ගලික අංශයේ ව්‍යාපාර සඳහාත් දේශපාලන ක්ෂේත්‍රයන්හී පවතින අවදානම් සඳහාත් මෙමගින් රක්ෂණ කටයුතු සිදු කෙරේ. ආයෝජන මතභේද සමථකරණය සඳහා වන ජාත්‍යන්තර මධ්‍යස්ථානය (ICSID) 1966දී ස්ථාපිත වේ. රාජ්‍යයන් හා එක් ව ආයෝජන අවධානම අඩු කිරීම මෙමඟින් සිදු වේ (කටුගම්පළ, 2007, 56). ලෝක බැංකුවට අයත් මෙම නියෝජිත ආයතනවල වර්ථමාන සාමාජික රටවල් ප්‍රමාණය ද, විමසා බැලිය යුතු ය. IDA සාමාජික රටවල් 173 කි. IFC සාමාජික රටවල් 184 කි. MIGA සාමාජික රටවල් 181 කි. ICSID සාමාජික රටවල් 153 කි (http://www.worldbank.org)

**ස්වාධීන තක්සේරු කණ්ඩායම්**

ලෝක බැංකු කටයුතු නිරීක්ෂණය කිරීම අරබයා (IEG) හෙවත් ස්වාධීන තක්සේරු කණ්ඩායම් විසින් ක්‍රියා කරනු ලැබෙන අතර මුල්කාලීනව මෙම කණ්ඩායම හඳුන්වනු ලැබුවේ (OED) හෙවත් මෙහෙයුම් තක්සේරු දෙපාර්තුමේන්තුව ලෙසිනි. මෙහිදී තක්සේරු වාර්තා මගින් අනාවරණය කරගන්නා තොරතුරු ලෝක බැංකුවේ විධායක අධ්‍යක්ෂ මණ්ඩලයට ලබා දීම සිදු කරයි. "ලෝක බැංකුවේ අරමුණු සාක්ෂාත් වීම පිළිබඳව අධ්‍යයනය කරමින් සාමාජික රාජ්‍යයන් දැනුවත් කිරීම ලෝක බැංකු මණ්ඩලය මගින් සිදු කිරීම එම තක්සේරු ඒකකයේ සේවාවකි "(කටුගම්පළ, 2007, 62).

**ලෝක බැංකුවේ අරමුණු හා කාර්යය**

ආර්ථික සංවර්ධනය සඳහා ණය පහසුකම් සැපයීම ලෝක බැංකුවේ ප්‍රධානතම අරමුණ වේ. ආරම්භක අවස්ථාවේ යුරෝපා රටවල මූල්‍ය අර්බුදයට ආධාර කිරීම මුඛ්‍ය අරමුණ බවට පත් වුවත් අනතුරුව එය තුන්වන ලෝකයේ රටවල් කරා ද, ව්‍යාප්ත වීය (ජයවර්ධන, 2011, 35). ලෝක බැංකුව සතු කාර්යන් පිළිබඳ විමසීමේ දී ආර්ථික උපදෙස් ලබාදීම, තාක්ෂණික ආධාර සැපයීම හා සංවර්ධනය වන රටවල ආයෝජනය සඳහා අන්‍යයන්ට මග පෙන්වීම යනාදී කාර්යයන් ප්‍රධාන වේ. තවදුරටත් මේ පිළිබඳ විමසුමක යෙදීමේ දී, සංවර්ධනය වෙමින් පවතින රටවල මානව සංවර්ධනයට ප්‍රමුඛස්ථානයක් ලබා දෙමින් ඒ යටතේ අධ්‍යාපන හා සෞඛ්‍ය ක්ෂේත්‍රයන්හී විවිධ අංශ සංවර්ධනයෙහිලා දායක වීම ද, හඳුනාගත හැකි තත්ත්වයකි (කටුගම්පළ, 2007, 54). කෘෂිකාර්මික සහ ග්‍රාමීය සංවර්ධන ක්ෂේත්‍රය යටතේ වාරිමාර්ග සහ ග්‍රාමීය සේවා කැපී පෙනේ.

පරිසර ආරක්ෂාව යන ඒකකය යටතේ පරිසර දූෂණය අවම කිරීම ඇතුළුව ඊට අදාළ නීති රීති සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීම යනාදිය මෙමගින් සිදු වේ. යටිතල පහසුකම් යන සුවිශේෂ ක්ෂේත්‍රය යටතේ මහා මාර්ග, විදුලිය වැනි අංශ සංවර්ධනය කරනු ලබයි. තවද , දූෂණ පිටු දැකීම නීති ක්ෂේත්‍රයෙහි ආයතන සංවර්ධනය කිරීම වැනි යහපාලන කටයුතු සිදු කිරීම ද ලෝක බැංකුව සතු කාර්යකි. "සහන පොළී අනුපාතය යටතේ සාමාජික රටවලට ණය ආධාර ලබා දීම මෙන් ම අතිශය දිළිඳු රටවලට ප්‍රදානයන් පිරිණැමීම ද, සිදු කෙරේ " (කටුගම්පළ, 2007, 54 ). එක් පසෙකින් ණය මුදල් හෝ ප්‍රදානයන් හරහා සාමාජික රාජ්‍යයන්ගේ ආර්ථික ප්‍රතිපත්ති විෂයෙහි පුළුල් වෙනස්කම් අපේක්ෂා කළ ලෝක බැංකුව අනෙක් පසින් මේ ණය ආධාර විශේෂ ව්‍යාපෘති හඳුන්වා දෙනු ලැබී ය.

## ලෝක බැංකුව හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අතර පවතින සබඳතාව

රටවල් 44 සහභාගීත්වයෙන් යුතුව 1945 දෙසැම්බර් මස 27 වන දින ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පිහිටුවන ලදි. ලෝක බැංකුවේ සාමාජිකත්වය ලබා ගැනීමට නම් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සාමාජිකත්වය ලබා ගත යුතු ය. ඒ නිසා කිසියම් සාමාජික රාජ්‍යයක් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ඉවත් වුවහොත් ලෝක බැංකුවෙන් ද ඉවත් වීමට සිදු වේ (ජයවර්ධන ,2011 , 356). මේ බව පහත සඳහන් දත්ත උපයෝගී කරගෙන ද තහවුරු කරගත හැකි ය.

IMF සංවිධානයේ වර්තමාන සාමාජික සංඛ්‍යාව 189කි (www.imf.org).

IBRD හෙවත් ලෝක බැංකුවේ සාමාජිකත්වය ලැබූ රටවල් සංඛ්‍යාව ද, 189 කි. (www.worldbank.org)

උදාහරණ වශයෙන් දක්වන්නේ නම් ශ්‍රී ලංකාව, කෙන්යාව, ස්විස්ටර්ලන්තය, චීනය, බ්‍රසීලය, පාකිස්ථානය ආදි රටවල් ඉන් කිහිපයකි. දෙවන ලෝක සංග්‍රාමය අවසන්වීමෙන් පසු ජාත්‍යන්තර මූල්‍ය ක්‍රමය මෙන් ම ආර්ථිකයත් බලවත් කම්පනයකට මුහුණපාන ලදි (සෙනවිරත්න , 2013 ,40 ). " මුදල පිළිබඳ අන්තර්ජාතික වශයෙන් සමාන තත්ත්වයක් ඇති කර ගැනීමත්, එම තත්ත්වය අඛණ්ඩව පවත්වා ගැනීමත්, වෙළඳාමට රුකුල්දීමත්, විධිමත් විනිමය ක්‍රමයක් පවත්වාගෙන යාම

මෙන් ම, තරගකාරි විනිමය අවප්‍රමාණය කිරීම වළක්වා ගැනීමට ද, බහු පාර්ශවීය ගෙවීම් ක්‍රමයක් ඇතිකර ගැනීමට ආධාර කිරීමට, වෙළඳාමට හිතකර විනිමය ක්‍රමයක් පවත්වා ගැනීමට ආධාර කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ආරම්භ කරන ලදි. ලෝක බැංකුව පිහිටුවීමට මූලික වූ බ්‍රෙට්න්වුඩ් සම්මුතියේ දී ම අංග සම්පූර්ණ මූල්‍ය ක්‍රමයක් සදහා සැළැස්මක් බිහි විය"(සෙනවිරත්න, 2013, 40). එක්සත් ජාතීන්ගේ අනුබද්ධිත ආයතනයක් වශයෙන් ලෝක බැංකුව ලෝක ආර්ථික රටාවේ සුවිශාල වෙනස්කම් රැසකට සම්බන්ධ වී ඇත. එහිදී ලෝක බැංකුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ දායකත්වය සෘජුවම ලබාගනී. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මෙහිදී මූලිකව ම ක්‍රියාමාර්ග 3ක් අනුගමනය කරනු ලබ යි. පළමු වැන්න වශයෙන්. මූල්‍යාධාර සැපයීම පෙන්වා දිය හැකි ය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විනිමය අනුපාතික ක්‍රමයේ තමන් සතු කොටස ඉටු කිරීමට පියවර ගැනීම දෙවන ක්‍රමය වශයෙන් හඳුන්වාදිය හැකි ය. තුන් වන ක්‍රමය වශයෙන් හඳුන්වා දිය හැක්කේ, විශේෂඥ ඥානය ඒ ඒ ආර්ථික අංශයන්හී ලබා ගැනිමට රටවලට සහය වීම යි. ලෝක බැංකුව හා සම්බන්ධවෙමින් ක්‍රියාත්මක වන ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පිළිබඳ විවිධ විවේචන ඇත. නමුත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සිය අනන්‍යතාවය නැතිවම බැරි ආයතනයක් ලෙස තහවුරු කොටගෙන තිබේ. ශ්‍රී ලංකාව ද, 1978 අංක 10 දරන පනතින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග ඇති සබඳතා තහවුරු කර ගත්තේය (සෙනවිරත්න, 2013, 4). මේ අනුව පැහැදිලි වනුයේ, ලෝක බැංකුව නිර්මාණය වීමේදීත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල එයට සම්බන්ධව තිබූ අතරම, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ හා ලෝක බැංකුවේ සාමාජිකත්වයන් අතරත් සබඳතාවක් පවතින බව යි. කෙසේ නමුත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ස්වාධීනව තම කටයුතු පවත්වාගන යන බවත් සිහි තබාගත යුතුව ඇත

## ලෝක බැංකුව ප්‍රදානය කරන ණය හා ආධාර

ලෝක බැංකුව ණය ප්‍රදානයේ දී ප්‍රධාන ප්‍රතිපත්ති 2ක් අනුගමනය කරනු ලැබේ. එම ක්‍රම 2ක වන්නේ, අයි.බී.ආර්.ඩී ණය ක්‍රමය හා අයි.ඩී.ඒ ණය ක්‍රමය වශයෙනි (සෙනවිරත්න, 2013, 31 ). අයි.ඩී.ඒ ණය ක්‍රමය ඉතාම සහනදායී වන අතර ඒ සඳහා පොළියක් අය නොකරයි. මෙහි සුවිශේෂත්වය වන්නේ, වසර 10 අනුග්‍රාහක කාලයක් ද, ඇතුළු වසර 40 කාලයක දී ණය ආපසු ගෙවීමට හැකියාව ලබාදී තිබීමයි. ලෝක බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්තිවල වෙනසක් 1950 ගණන්වල සිට දිස් විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් සංවර්ධිත රටවලට වඩා සංවර්ධනය වෙමින් පවතින රටවලට ණය ආධාර ලබා දීමට උනන්දු වී ඇත. මෙහි ප්‍රතිඵලය වී ඇත්තේ, කලාපීය වශයෙන් පිහිටුවාගෙන ඇති දකුණු ඇමරිකානු සංවර්ධන බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, අප්‍රිකානු සංවර්ධන බැංකුව යනාදිය සමග ලෝක බැංකුව සමීප සබඳතාවයෙන් කටයුතු කිරීම යි. ණය හා ආධාර යටතේ ලෝක බැංකුව අපේක්ෂා කරන්නේ සාමාජික රටවල නිෂ්පාදන කාර්යයන්ට අවශ්‍යය වන ප්‍රාග්ධන ආයෝජන පහසුකම් සලසා දීම, විදේශීය ආයෝජන දිරි ගැන්වීම, ජාත්‍යන්තර වෙළඳාමේ තුලිත වර්ධනයක් සඳහාත් ගෙවුම් ශේෂ හිගය පියවා ගැනීම සඳහා ආධාර කිරීමත්ය. ලෝක බැංකුවෙන් විශේෂයෙන් ම තුන්වන ලෝකයට ලබා ගන්නා ණය හා ආධාර පිළිබඳ විවිධ මතවාද පවතී. ආරම්භක අවස්ථාවේ දී මහා පරිමාණ කර්මාන්ත උදෙසා ආධාර කරනු ලැබුවත් පසුකාලීනව සුළු පරිමාන කර්මාන්ත යෝජනා ක්‍රමවලටත් ආධාර කිරීම අරබා ඇත. දැනට ලෝක බැංකුවෙන් ලබා දෙන ආධාරවලින් 20%ක් වෙන් වී ඇත්තේ ග්‍රාමීය සංවර්ධන අංශයේ සංවර්ධන ව්‍යාපෘති සඳහායි. 1981 දක්වා ලෝක බැංකුව මගින් විවිධ ව්‍යාපෘති සඳහා ලබා දී ඇති ආධාර ප්‍රමාණය ඩොලර් දශලක්ෂ 6097.7ක් බව වාර්ථාවලින් අනාවරණය වේ (සෙනවිරත්න, 2013, 33). ලෝක බැංකුව ආධාර සපයන විට පදනම් කොටගත් තේමාවන් 5කි. එනම් ලෝක දිළිඳුකම අවම කිරීම, පරිසරය ආරක්ෂා කිරීම, ජනතාවට තමන්ගේ හැකියාවන්ගේ උපරිම අන්දමින් ප්‍රයෝජනය ගැනීම සඳහා අධ්‍යාපනය, පෝෂණය, පවුල් සැළසුම පිළිබඳ ව ආධාර කිරීම, සාමාජික රටවල ණය බර ලිහිල් කිරීමට කටයුතු කිරීමත් ආර්ථිකය වර්ධනය කිරීමට උපකාරී වීම, පෞද්ගලික අංශය ශක්තිමත් කිරීමට කටයුතු කිරීම යනාදියයි. එසේම ලෝක බැංකුව විසින් ප්‍රදානය කරන ණය පිළිබඳව අවධානය යොමු කිරීමේ දී, ලෝක බැංකුව සිය සාමාජික රටවලට ණය සැපයීමේ දී, ණය ගැනීම් හා වියදම් මත පදනම් කරගත් පොළී අනුපාතිකයක් භාවිත කරයි. එසේම දරිද්‍රතාවෙන් පෙළෙන රටවලට මූල්‍ය ණය පහසුකම් සැපයීම සඳහා සංවර්ධිත රටවල දායක මුදල් යොදාගනු ලැබේ. ලෝක බැංකුව ණය සපයන අංශ කිහිපයකි. එනම්, කෘෂිකාර්මික සහ ග්‍රාමීය ආර්ථිකය

දියුණු කිරීමට අවශ්‍ය ආධාර සැපයීම. වන වගාව, ධීවර කර්මාන්තය, වාරිමාර්ග හා ජලාපවාහන, සත්ත්ව පාලනය, බහුවාර්ගික භෝග වගාව, පර්යේෂණ හා ව්‍යාපෘති අංශය, කාර්මික අංශයේ ණය, ඉංජිනේරුමය අංශය, රසායනික නිෂ්පාදන, යකඩ නිෂ්පාදනය, රෙදිපිළි නිෂ්පාදනය මෙන් ම කැනීම් කටයුතු අංශය, සංචාරක කර්මාන්තය, ප්‍රවාහන අංශය, වරාය සහ ගුවන් තොටුපල සංවර්ධනය කිරීම, සෞඛ්‍යය සංරක්ෂනය සහ පෝෂණය, හදිසි ආපදාවලදී ආධාර දීම, තොරතුරු තාක්ෂණය වෙනුවෙන් ණය ආධාර දීම යනාදිය ඒ අතර වේ (සෙනවිරත්න, 2013, 3 ). කෙසේ වෙතත් මේ ආකාරයට වන ලෝක බැංකුවේ ණය හා ආධාර පිළිබඳව විවිධ විවේචන පවතී. සාමාජික රටවලට, විශේෂයෙන් ම තුන්වන ලොකයේ රටවලට ණය හා ආධාර ලබා දීමේ දී, ලෝක බැංකුව මගින් ඉදිරිපත් කර ඇති උපදෙස් මාලාව හා කොන්දේසි පිළිබඳ දැඩි විවේචන පවතී. මින් පැහැදිලි වන්නේ ලෝක බැංකුවේ ණය හා ආධාර ප්‍රදානයන් සම්බන්ධව සාධනීයතා සේම නිශේධනීයතා ද ඇති බව යි.

ලෝක බැංකුවෙහි ක්‍රියාත්මක අංශය පිළිබඳ ව සාධනීයතාවන් පැවතුනත්, ඒ සාධනීයතාවන් අභිබවා ප්‍රබල විවේචනයක් එල්ල වී ඇත. එනම්, ණය ගන්නා රටවල දැවැන්ත දේශපාලනික, ආර්ථික බලයක් ලෝක බැංකුව විසින් අත්පත්කරගන ඇති බව යි. ඒ නිසා ලෝක බැංකුවෙහි ක්‍රියාත්මක අංශය පිළිබඳ ව කෙරෙන මෙම විචිරණය, එම මතය කොතෙක් දුරට සත්‍ය ද අසත්‍ය ද, යන්න විමර්ශනය කේන්ද්‍ර කොටගෙන ගොඩනගා තිබේ. ප්‍රථමයෙන් ම ශ්‍රී ලංකාව කෙරෙහි අවධානය යොමු කිරීමේ දී, ලංකාව මෙම සංවිධානයේ සාමාජිකත්වය 1950 දී ලබාගත් අතර, 1954 දී ආධාර ලබා ගැනීම අරබන ලදි. මෙම ආධාරවලින් සියයට 30ක් බලශක්ති දියුණුව සඳහා ද, සියයට 50ක් කෘෂිකාර්මික අංශය සඳහා ද, වෙන්වී ඇත (සෙනවිරත්න, 2013, 3 ). ආර්ථික සංවර්ධන ව්‍යාපෘති යටතේ ලංකාවට ලෝක බැංකුව විසින් අයි.ඩී.ඒ ණය ක්‍රමය යටතේ ආධාර ලබා දීමට නිර්දේශ කොට ඇත. 2013 වර්ෂය වන විට ලෝක බැංකුව ලබා දුන් ණය පිළිබඳ විමසීමේ දී, ඇමරිකානු ඩොලර් 21ක් වටිනා අයි.බී.ආර්.ඩී ණය 12ක් ද, කෝටි 20 ලක්ෂයකට වඩා අයි.ඩී.ඒ ණය 61ක් ද, ලෝක බැංකුව ඔස්සේ ලංකාවට ලබා දී ඇත (සෙනවිරත්න, 2013, 37). කොළඹ පරිසර සංවර්ධන යෝජනා ක්‍රමය, කොළඹ ප්‍රවාහන යෝජනා ක්‍රමය යන යෝජනා ක්‍රම රැසකට ලෝක බැංකුව ආධාර කොට තිබේ. එසේ වුවත් මතු පිටින් මතුපිට සාර්ථක බවක් පමණක් ඒ තුළ පෙනෙන්නට විය. යථාර්ථය වූයේ, එම ණය හා ආධාර ලබාදීමේ දී ලෝක බැංකුව විසින් ලංකාවට කොන්දේසි, ගිවිසුම් ස්වභාවයෙන් ඉදිරිපත් කර ලංකාව හා ඇතිකරගත ඇති එකඟතා තුළ වැඩි වාසිය ලෝක බැංකුවට ම හිමි වූ බව යි. මේ තුළ සිදු වූයේ තුන් වන ලොක්යේ රටක් වන ලංකාව ණය උගුලකට හසුවීම යි. ඒ තුළ ක්‍රියාත්මක වන්නේ පියවි ඇසට නොපෙණෙන නව යටත් විජිතවාදයයි. මේ දක්වාම ලංකාව ලබාගත් ණය හා ආධාර මගින් ලංකාවේ සංවර්ධන ඉලක්ක ඒ අයුරින්ම, සපුරාගත නොහැකිවීම ද, එයට කදිම නිදසුනකි. " 1987 වන විට ශුද්ධ ප්‍රාග්ධනය බැංකුවෙන් පිටතට ගලායාමට වඩා, බැංකුව තුළට ගලා ඒම ඉහළ මට්ටමක පැවතිණි. එය සිදු වූයේ, බැංකුව ණය දුන් ප්‍රමාණයට වඩා, විශාල මුදලක් ණය ගත් රටවලින් ගෙවීම් ලෙස ලැබීම හේතුවෙනි"(අලහකෝන්, 2013, 13 ). "1980 අගභාගය වන විට ආසියාවේ, අප්‍රිකාවේ හා ලතින් ඇමරිකාවේ ලක්ෂ සංඛ්‍යාත දරුවන් සඳහා වූ, සෞඛ්‍යය, පෝෂණය, අධ්‍යාපනය පහළ වැටීමට ලෝක බැංකුවේ ව්‍යුහාත්මක ගැලපුම් වැඩසටහන් වගකිව යුතු බව යුනිසෙෆ් ආයතනය වාර්තා කළේය. බැංකුවෙන් ණයගත් බොහෝමයක් රටවල් සඳහා එය අහිමි දශකයක් විය (අලහකෝන, 2013 , 136). ලෝක බැංකුවේ මැක්නමාරා යුගය පිළිබඳ විමසීමේදී ද, මැක්නමාරාගේ දිළිඳුකම අවසන් කිරීමේ දශකය නිමාවූයේ, දකුණු දිග ඉහළ ණය බරත්, ඉහළ ස්තරානුගත වගාක්‍රමයත් සමඟය. ආහාර නිෂ්පාදනයේ දේශීය ක්‍රම විනාශ කිරීමත්, අපනයනය මූලික නිෂ්පාදනය දිරිගැන්වීමත් සමග එක්සත් ජනපදයෙන් හා යුරෝපයෙන්, ආහාර ගෙන්වන ශුද්ධ ආනයනකරුවකු බවට දකුණු දිග පත් විය. මේ කිසිදු වෙනස්කමක් සංවර්ධනයේ ගැටලු විසඳීමට හෝ අන්ත දිළිඳුභාවය කැපී පෙනෙන ලෙස අඩු කිරීමට සමත් නොවීය. ඒ වෙනුවට සිදු වූයේ, බැංකුවේ සංවර්ධන කර්මාන්තයේ ප්‍රතිඵලයක් ලෙස දිළිඳුකම වර්ධනය වීම යි.

## විවේචන

ලෝක බැංකුවේ ආයතනික ව්‍යූහය හා ක්‍රියාකාරකම් පිළිබඳ ව විවිධ පිරිස් වෙතින් විවිධ චෝදනා එල්ල වේ. ඉන් ප්‍රධාන විවේචනය වන්නේ ලෝක බැංකුව ඇමරිකානු හා බටහිර මෙවලමක් ලෙස කටයුතු කරමින්, විශේෂයෙන් ලෝක බැංකුවේ ආර්ථික මූලධර්ම පවා බටහිර අවශ්‍යතා මත නිර්මාණය කර තිබෙන බවයි. ඉලිනොයිස් හා ඉයෝවා විශ්වවිද්‍යාලයත් චිකාගෝ සරසවියත් උපයෝගී කරගනිමින් ලෝක බැංකුව විසින් ණය ගන්නා රටවල කෘෂි ආහාර පද්ධති, දේපළ හිමිකම් , සම්ප්‍රදායන් හා තත්ත්වයන්, වෙළඳ හා ආයෝජන නීති යනාදිය ද, ඇමරිකානුකරණය කරන ලදි (සිරිසේන , 2008 , 131). ලෝක බැංකුවේ ක්‍රියාකාරකම් පිළිබඳ ව ඇති විවේචනයන් අතර තවත් ප්‍රබල විවේචනයක් වන්නේ, ලෝක බැංකුවේ පෙන්නුම් කරන ඉලක්ක සහ සැබෑ ඉලක්ක අතර පවතින ගැටලුව යි. මීට අනුව "ඔවුන් සංවර්ධනය වෙමින් පවතින රටවලට මූල්‍යමය ආධාර ලබාදීමෙන් පවා අදහස් කරන්නේ එම රටවල් කෙරෙහි එක්තරා ආකාරයක ආධිපත්‍යය පැතිරවීම යි. (ජගත්, 2012, 117). මේ ආකාරයට බටහිර ආර්ථික බලපෑම පිළිබඳ ජාතිවාදීන් තුළ ඇති සැකය ඔවුන්ගේ නව යටත්විජිතවාදය යන න්‍යායෙන් ද, ප්‍රකාශිතය (සිරිසේන, 2008, 64). 1999 නොවැම්බර් මාසයෙහි සියටල් නගරයේ පැවැත්වීමට ගිය ලෝක වෙළඳ සංවිධානයේ ඇමතිවරුන්ගේ සම්මේලනයට විරෝධය පෑම සඳහා සංවිධානය කළ පෙළපාලියට සහභාගී වූ විශාල සංඛ්‍යාවෙන් කියා පෑවේ ද, දුප්පත් රටවල් මත බලෙන් පටවන ලද මේ විවෘත වෙළඳපළ හා ආර්ථිකයටත් නිදහස් වෙළඳ ප්‍රතිපත්තියටත් ඇති විරෝධයයි (සිරිසේන, 2008, 73). ලෝක බැංකුවේ භූමිකාව පිළිබඳ විවේචනයට මෙන් ම විවාදයට තුඩු දී ඇති ක්ෂේත්‍ර සංකීර්ණය. "2005 වසරේ මැසේ" දේශනයට සහභාගී වූ ස්ටෙපාන් ලුවිස් ඉදිරිපත් කළ "කාලයට එරෙහිව ජනවර්ග" යන මැයෙන් කළ තර්ක තුළ ගොනු කළේ ලෝක බැංකුවේ හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රතිව්‍යුහගත කරන පිළිවෙත් යටතේ ලබා දුන් ආධාර ඒඩ්ස් වසංගතය පැතිරයාමට දායක වූ බව යි (කටුගම්පළ ,2007, 60). කැතරින් මහත්මියට අනුවත් දිළිඳු රටවල් ණය උගුලකට හසුවී ඇත්තේ ලෝක බැංකුවේ මූලධර්ම හා කොන්දේසි නිසා ය (කටුගම්පළ, 2007, 61).

## නිගමනය

සමස්තය සමාලෝචනය කිරීමේ දී, යුරෝපයේ උද්ගත වූ ප්‍රබල මූල්‍ය අර්බුදයට විසඳුම් ලෙස දෙවන ලෝක යුද සංග්‍රාමයෙන් පශ්චාත් කාලීනව 1945.12.27 වන දින ලෝක බැංකුව ස්ථාපිත වූ බවත්, ආර්ථික සංවර්ධනය හා දිළිඳුකම පිටු දැකීම එහිලා මුඛ්‍ය පරමාර්ථ වූ බවත් පැහැදිලි විය. සමාරම්භක අවස්ථාවේ යුරෝපීය රාජ්‍යයන් කේන්ද්‍ර කරගත් ලෝක බැංකුව අනතුරුව තුන් වන ලෝකයේ රටවල් උදෙසා විවිධ ප්‍රදානයන් හා මූල්‍ය ආධාර ලබා දීමට ඉදිරිපත් වීමත් විශේෂ සිදුවීමකි. මේ අයුරින් තුන්වන ලෝකයේ රටවල් ලබා ගන්නා ණය හා ආධාරත් යුරෝපීය රාජ්‍යයන් ලබා ගන්නා ණය සහ ආධාරත් නිසා එක් පසෙකින් ඒ රාජ්‍යයන්හී ඇතැම් අංශ සංවර්ධනය වුවත් අනෙක් පසින් විවිධ ආර්ථික හා ප්‍රතිපත්තිමය වශයෙන් පනවන සම්බාධක නිසා මෙම රටවල් ණය උගුලකට හසු ව තිබීම ද, හඳුනාගත හැකි ය. මෙවැනි හේතු කාරණා නිසා ලෝක බැංකුවේ න්‍යායාත්මක අරමුණු ප්‍රායෝගික අරමුණු සමග ගැටීම පාදක කරගෙන අදාළ ක්ෂේත්‍රයන් පිළිබඳ සාධනීයතා සේම නිශේධනීයතා ද, හඳුනාගත හැකි බව නිගමනය කළ හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ


අලහකෝන්, යු., 2013., *ලෝක බැංකුවේ හරිත සංහාරය*, කොළඹ: සංහිඳ ප්‍රකාශන.

කටුගම්පළ, ආර්., 2007. *එක්සත් ජාතීන්ගේ සංවිධානය*, කොළඹ: ගොඩගේ ප්‍රකාශන.

ජගත් චන්ද්‍ර, එන්., 2012. *යුධ අපරාධ චෝදනාවේ ඇත්ත කතාව*, නුගේගොඩ: ගොඩගේ ප්‍රකාශන.

ජයවර්ධන, ඩබ්ලියු., 2011.*දේශපාලන විද්‍යාව 2*, ප්‍රියදර්ශනී ප්‍රකාශන.

සිරිසේන,එම්.,2008.ලෝක *බැංකුව ගෝලීයකරනය හා නව යටත්විජිතවාදය*, නුගේගොඩ: ගොඩගේ ප්‍රකාශන.

සෙනවිරත්න., 2013. *ලෝක සංවිධාන* 1, දයාවංශ ජයකොඩි සහ සමාගමේ ප්‍රකාශනයකි.

www.worldbank.org

www.imf.org